රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 48/89

(4)

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය - කොළඹ 07.

1989 ඔක්තෝම්බර් මස 6 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත.

1979 අංක 48 දරණ ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ සහ හදිසි නීති යටතේ අත්අඩංගුවට ගන්නා ලද නිලධරයන්/ සේවකයන් නැවත සේවයේ පිහිටුවීම.

ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව ( මූලික පරීක්ෂණයක නිගමන පදනම් කොටගෙන ) පවත්වනු ලබන විධිමත් පරීක්ෂණයකින් පසුව පහත දක්වා ඇති වර්ගවලට අයත් වන රාජ්‍ය නිලධාරීන් සහ රාජ්‍ය සංස්ථා සේවකයන් නැවත සේවයේ පිහිටුවිය යුතු යයි තීරණය කර ඇත.

(I) 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ සහ/ හෝ හදිසි රෙගුලාසි යටතේ අත්අඩංගුවට ගන්නා ලදුව සාක්ෂි නොමැතිවීම හේතුකොට ගෙන ගරු ඇටෝර්නි ජනරාල් වරයාගේ නිර්දේශ පිට මෙම විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ රාජ්‍යාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ මුදාහරිනු ලැබූ නිලධරයන්/ සේවකයන් ;

(II) ඉහත සඳහන් පනත/ හදිසි රෙගුලාසි යටතේ නඩු පවරනු ලැබ පසුව අධිකරණයකින් නිදොස් කරනු ලැබූ හෝ අධිචෝදනා ඉල්ලා අස්කර ගැනීම නිසා මුදාහරිනු ලැබූ නිලධරයන්/ සේවකයන්;

(III) ඉහත සඳහන් පනත/ හදිසි රෙගුලාසි යටතේ හෝ වෙනත් කිසියම් නීතියක් යටතේ හෝ සිදුකර ඇති වරදවල් සම්බන්ධයෙන් අධිකරණයක දී වරදකරුවන් වූ නිලධරයන් / සේවකයන්;

(IV) විෂය භාර අමාත්‍යවරයා විසින් හෝ රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ මුදාහරින ලදුව, ඉන්පසු ඔවුන් මුලදී අත්අඩංගුවට ගැනීමට හේතු වූ වරදම සම්බන්ධයෙන් අධිකරණයක නඩු පවරනු ලැබ ඊට වරදකරුවන් වූ නිලධරයන් / සේවකයන්;

2 පිටුවට.....

(v) අධිචෝදනා නිවේදනය මත/ ඇටෝර්නි ජනරාල්වරයා විසින් අදාළ අධිචෝදනා ඉල්ලා අස්කර ගන්නා ලද්දාවූ නිලධරයන්/සේවකයන්;

02. කෙසේ වෙතත් ඉහත I වර්ගයට ගැනෙන රාජ්‍ය නිලධාරීන්ට / රාජ්‍ය සංස්ථා සේවකයින්ට යහපත් සේවා වාර්තාවක් තිබේනම්, අදාළ අමාත්‍යවරයාගේ ද එකඟතාවය ඇතිව විධිමත් පරීක්ෂණයකින් තොරව ඔවුන් නැවත සේවයේ පිහිටුවිය හැකිවේ.

03. ඉන්දියානු සාමසාධක හමුදාව විසින් අත්අඩංගුවට ගෙන පසුව නිදහස් කරනු ලැබ ඇති නිලධාරීන් සම්බන්ධව ද මෙම ක්‍රමයම අනුගමනය කළ යුතුවේ.

04. අත්අඩංගුවේ සිටි කාලය සඳහා වැටුප් ගෙවීම, පරීක්ෂණයේ නිගමනය මත තීරණය කළයුතුය.

05. මෙම චක්‍රලේඛය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය ඇතිව නිකුත් කෙරේ.

(පී. එච්. එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

ඒ/